**IPRC/16/76**

# සමාජ විශ්වලේඛනයන්හි හුවමාරු සාධාරණත්වය නමැති සංකල්පයෙහි විකසනය පිළිබඳ අධ්‍යයනයක්

ක්‍රිෂානි පෙරේරා[1]

සාධාරණත්වය පිළිබඳ සමාජ දැක්ම විමසීමේදී 1891 වර්ෂයේ පටන් ඇරඹුණු සමාජ විශ්වලේඛනයන්හි මූලිකව දැකිය හැකි වනුයේ ඇරිස්ටොටේලියානු සම්ප්‍රදායානුගතව විග්‍රහයට ලක් කරන ලද තෝමස් ඇක්වයිනාස්ගේ සාධාරණත්වය පිළිබඳ අර්ථකථනයයි. එය පොදු සාධාරණත්වය (general justice - legal justice) සහ වෛශේෂික සාධාරණත්වය (particular justice) ලෙස වර්ග කළ හැකි අතර වෛශේෂික සාධාරණත්වය ද නැවතත් ව්‍යාපි සාධාරණත්වය (distributive justice) සහ හුවමාරු සාධාරණත්වය (commutative justice) යනුවෙන් බෙදා දක්වේ. මෙම පර්යේෂණයේදී මූලික අවධානය යොමු වනුයේ කතෝලික සභා සමාජ විශ්වලේඛන මඟින් හුවමාරු සාධාරණත්වය පිළිබඳ ඉදිරිපත් කර ඇති චින්තනය සම්බන්ධවය. වදන් විශ්ලේෂණ විග්‍රහය නැතහොත් සාහිත්‍ය විචාරය (literary criticism) යන ක්‍රමවේදයට අනුගතව සිදුකෙරෙන්නාවූ මෙම පර්යේෂණයේ අරමුණ වනුයේ 1891 වර්ෂයේදී xiii ලියෝ පාප්තුමා විසින් ප්‍රකාශයට පත්කරන ලද වෙහෙසෙන මිනිස්සු (Rerum Novarum) සමාජ විශ්වලේඛනයේ සිට එයට වසර සියයක් පිරීම නිමිත්තෙන් 1991 වර්ෂයේදී ii ජුවාම් පාවුළු පාප්තුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද සියක් වසර (Centesimus Annus) සමාජ විශ්වලේඛනය දක්වා වසර සියයක් පුරාවට හුවමාරු සාධාරණත්වය නමැති සංකල්පය විකසනය වූ ආකාරය විග්‍රහයකට ලක් කිරීමයි. මෙම පර්යේෂණ මාතෘකාව සම්බන්ධව සාහිත්‍ය විචාරානුකූල අධ්‍යයනයක් මෙතෙක් සිදුවී නොමැති අතර දේවධර්මවේදීන් වන ඩේවිඩ් හොලන්බක් (David Hollenbach) සහ චාල්ස් ඊ.කරන් (Charles E. Curran) සාධාරණත්වය නමැති සංකල්පය සමාජ විශ්වලේඛනයන්හි යෙදී ඇති ආකාරය පිළිබඳ අධ්‍යයනයට ලක්කොට ඇතිමුත්, හුවමාරු සාධාරණත්වය පිළිබඳ සාහිත්‍ය විචාරානුකූල විග්‍රහයක් ඉදිරිපත් කර නැත. එම පර්යේෂණ රික්තය සම්පූර්ණ කරලීම අරභයා මෙම අධ්‍යයනය වැදගත් වේ.

***ප්‍රමුඛ පද :*** *තෝමස් ඇක්වයිනාස්, පොදු සාධාරණත්වය, වෛශේෂික සාධාරණත්වය, සමාජ විශ්වලේඛන, හුවමාරු සාධාරණත්වය*

[1] හටහිර සම්භාව්‍ය සංස්කෘතික අධ්‍යනය හා ක්‍රිස්තියානි අධ්‍යන අංශය